# සොසූර්ගේ ගවයා

ප්‍රත්‍යක්ෂයක දී සිදුවන්නේ කුමක් ද යන්න තවදුරටත් විග්‍රහ කළ යුතු ය. පොල් ගෙඩිය වැටීම අපි ප්‍රත්‍යක්ෂ කරන්නෙමු. එය හුදු පංචේන්ද්‍රිය ගෝචර අත්දැකීමක් නොවේ. මනස හා සංකල්ප නොමැතිව පොල් ගෙඩිය, වැටීම ආදී සංකල්ප අපට අවබෝධ කර ගත හැකි නොවේ. කෙටියෙන් කියන්නේ නම් මනසක් නොමැතිව මේ කිසිවක් ගැන අපට වැටහීමක් නැත. අනෙක් ඉන්ද්‍රිය මගින් යම් යම් දේ දැනගැනීම සඳහා මනස අවශ්‍ය වුව ද, මනසට යමක් දැනගැනීමට අනෙක් ඉන්ද්‍රිය අවශ්‍ය නොවේ. ඒ බව බෞද්ධයන් තේරුම් ගෙන ඇත්තේ අද ඊයේ නොවේ. චක්ඛු විඥානය ආදිය හා සම්බන්ධ කොටස් දෙකක් වෙයි. එක් කොටසක චක්ඛු වෙයි. අනෙක් කොටසෙහි විඥානය වෙයි. චක්ඛු ආදිය ඇස් ආදී පංචේන්ද්‍රිය හා සම්බන්ධ වෙයි. විඥානය මනස හා බැඳෙයි. එහෙත් මනෝ විඥානය යැයි කියු තැන ඇත්තේ මනස පමණ ය. එහි දී මනස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රියක් සම්බන්ධ නොවෙයි.

මෙහි තේරුම අනෙක් ඉන්ද්‍රිය නොමැතිව මනසට යම් යම් සංකල්ප නිර්මාණය කර ගත හැකි බව ය. පොල් ගෙඩිය යන සංකල්පය නිර්මාණය කර ගැනීමේ දී අපට ඇස, ස්පර්ශය ආදී අවයව අවශ්‍ය වෙයි. පොල් ගෙඩියේ හැඩය, තද බව, පැහැය ආදිය පමණක් නොව එහි සුවඳ ද අපට දැනගත හැකි ය. පොල් ගෙඩිය යන්න සංයුක්ත සංකල්පයක් වෙයි. එය මනසට මෙන් ම පංචේන්ද්‍රියට ද ගෝචර වෙයි. පොල් ගෙඩිය පමණක් නොව දෙල් ගෙඩිය, ඔළු ගෙඩිය ආදිය ද, පුටුව , මේසය, කමිසය වැනි දෑ ද සංයුක්ත සංකල්ප වෙයි.

එහෙත් මේ සංකල්ප ද මනසේ නිර්මාණ බව අමතක නොකළ යුතු ය. පොල් ගෙඩිය යනුවෙන් දෙයක් මනසින් තොරව නොපවතියි. මෙරට සිටින තකතීරු පශ්චාත්නූතනවාදීන්ට මේ කරුණ තේරුම් ගත නොහැකි බව ඔවුන් ලියා ඇති දෙයින් පැහැදිලි වෙයි. මනසින් තොරව යමක් (යථාර්ථයක්) පවතින බව මනසින් තොරව පෙන්වා දිය හැකි නොවේ. එසේ පවතින බව පෙන්නුම් කරන්න යැයි අභියෝග කළ විට ඔවුහු සුපුරුදු ලෙස ලිංගික ක්‍රියා ආශ්‍රයෙන් ඒ සඳහා උදාහරණ දෙති. සිංහලයන්ට හොඳ කුණුහරුප කිය හැකි වුවත් (සිංහල භාෂාවේ ඉතා ඉහළ කුණුහරුප ඇත!) ඔවුහු ආවට ගියාට කුණුහරුප නොකියති. කුණුහරුප වුව ද තැන නොතැන බලා කීමෙන් එහි අගය අඩුවෙයි. කුණුහරුප හෝ ලිංගික උදාහරණ නැතිව වෙනත් උදාහරණ මගින් යමක් තේරුම් ගත හැකිව තිබෙන විට එවැනි උදාහරණ ඉදිරිපත් කිරීම අනවශ්‍ය වුවකි. එසේ තැන නොතැන බලා ලිංගික උදාහරණ දීමෙන් හෙළිවන්නේ ඒ උදාහරණ දෙන්නන්ගේ මනස ය. ඔවුහු සුවකළ නොහැකි හීනමානයකින් පෙළෙන්නෝ වෙති. පොරවල් වීමට ඇති අවශ්‍යතාවය හා වෙනත් හීනමානවලින් පෙළී කුණුහරුප කියන්නවුන් හැඳින්වීමට නම් හොඳවායින් කුණුහරුප යොදා ගැනීමේ වරදක් නැත.

පොල් ගෙඩියක් වැටෙන්නේ මනසින් තොරව යැයි යමකුට කිව හැකි ය. මනසින් තොරව යම් යම් දේ පවතින බවට උදාහරණයක් ලෙස යමකුට පොල් වැටීම ඉදිරිපත් කළ හැකි ය. අපි මෙය විභාග කරමු. අප සිටියත් නැතත්, එනම් මනස් සහිත සත්ත්වයන් සිටියත් නැතත් පොල් නොවැටෙන්නේදැයි යමකු ඇසීමට ඉඩ ඇත. එයට පිළිතුර නැත යන්න ය. පොල් වැටෙන්නේ මිනිසුන් පොල් වැටීමක් ගැන සිතන නිසා ය. ඒ සඳහා පොල් වැටීම ආදී සංකල්ප නිර්මාණය කරගෙන ඇති නිසා ය. මිනිස්සු පොල් වැටෙන බව ප්‍රත්‍යක්ෂයෙන් දනිති. ප්‍රත්‍යක්ෂය මනස හා සම්බන්ධ ය. මනසින් තොරව ප්‍රත්‍යක්ෂයක් නැත. මනසින් තොරව යමක් පවතින බව පෙන්නුම් කිරීමට මනසින් තොරව බැරි බව ඉදිරිපත් කරන උදාහරණවලින් ම පැහැදිලි වෙයි. පොල් ගෙඩි වැටීම පිළිබඳ උදාහරණයේ සියළු සංකල්ප මනසේ නිර්මාණ වෙයි. පොල් ගෙඩිය යන සංකල්පය ඉදිරිපත් වන්නේ මනසිනි. කිසිම වචනයක් මනසින් තොරව භාවිතා කළ හැකි නොවේ. මනසින් තොරව සංකල්ප නැත.

උදාහරණයක් ඉදිරිපත් කිරීමට සූදානම් වූ වහාම ඒ ප්‍රශ්නය ඇතිවෙයි. උදාහරණ ඉදිරිපත් කිරීමට සිදුවන්නේ වචන, සිතුවම්, සංගීතය ආදිය හරහා ය. (සිතීමේ එකම මාතය කසිකබල් පශ්චාත්නූතනවාදී අනුකාරකයන් කියන ආකාරයට භාෂාව නොවේ. බටහිර විද්‍යාවන් අනුව භාෂා ඇති වූයේ මිනිස් විකාශයේ යම් අවධියක දී ය. සිතීමට භාෂා අනිවාර්ය නම් බටහිර අනෙක් මතිමතාන්තර සමග ගත්විට ඉන් කියැවෙන්නේ කලින් ද සඳහන්කර ඇති පරිදි භාෂා ඇති වීමට පෙර මිනිසුන් නොසිතූ බව ය.) භාෂාව, චිත්‍ර, සංගීතය ආදිය මනසක් නැතිව යොදාගත හැකි

© Prof. Nalin De Silva

නොවේ. භාෂාවක් නැතිව සිතන්නට හැකි වුවත් මනසක් නැතිව සිතීමට  නොහැකි ය. මනසින් තොරව යමක් ඇති බව පෙන්නීමට යොදාගත හැකි යැයි සිතන සෑම උදාහරණයක් ම අවසානයේ දී මනස ආධාරයෙන් ම ඉදිරිපත්කිරීමට සිදු වෙයි. ඉන් ගැලවීමක් නැත. මනසින් තොරව යමක් ඇතැයි මනසින් තොරව පෙන්වා දිය හැකි නොවේ. මෙරට කසිකබල් පශ්චාත්නූතනවාදී ඇංකරයන්ට ඉහත සඳහන් කරුණු හෝ තේරුම් ගැනීමට බුද්ධියක් නැත.

අපි මෙය තවදුරටත් විභාග කරමු. පොල් යන සංකල්පය ගන්න. පොල් යනු කලින් සඳහන් කරන ලද පැහැයක්, තද බවක් ආදී ගුණ ඇති දෙයක් පමණක් නොවේ. සිංහල සංස්කෘතියෙහි පොල් ගෙඩිය යනුවෙන් කී විට හැඟෙන්නේ ඉංගිරිසියෙන් coconut  යනුවෙන් කී විට හැඟෙන්න ද නොවේ. සොසූර් නම් වාග් විද්‍යාඥයාට අනුව භාෂාවේ සංඥායකය (signifier) හා සංඥායිතය (signified) යනුවෙන් කොටස් දෙකක් ද, ඒ කොටස් දෙක ද ඉක්ම වූ ප්‍රඥප්තය (referent) යනුවෙන් දෙයක් ද ඇත. අපි උදාහරණයක් සඳහා සොසූර් පඬිවරයා යොදා ගන්නා ආකාරයේ වචනයක් ගනිමු. ඔහු මෙවැනි කරුණක දී සංසන්දනය කරන්නේ ඉංගිරිසි භාෂාව හා ප්‍රංශ භාෂාව වෙයි. අපි මෙහි දී සිංහල භාෂාව හා ඉංගිරිසි භාෂාව සංසන්දනය කරමු.

අපි ගවයා යන වචනය හා ඉංගිරිසි bull යන වචනය සලකා බලමු. ගවයා යනු කතා කරන භාෂාවෙහි ශබ්දයකි. ලියූ විට එය රූපයක් වෙයි. මේ ගවයා යන ශබ්දයෙහි නෛසර්ගික තේරුමක් නැත. ඒ ශබ්දය හෝ රූපය සංඥායකය වෙයි. මේ සංඥායකය ඉංගිරිසි කතාකරන විට හෝ ඉංගිරිසි ලියන විට හෝ යොදාගතහොත් ඉන් කිසිවක් නොහැඟවෙයි. එනම් ඒ සංඥායකය සංඥායිතයක් බවට පත් නොවෙයි. අයි සෝ අ ගවයා (I saw a gavaya) යන්න තේරුමක් ඇති දෙයක් නොවේ. ශබ්ද හෝ රූපවලට හෝ නෛසර්ගික තේරුම් නැත. ශබ්දයකට, එනම් මෙහි දී සංඥායකයකට තේරුමක් ලැබෙන්නේ යම් සංස්කෘතියක් තුළ යම් සන්දර්භයක් තුළ ය. සංස්කෘතියකින් හා සන්දර්භයකින් බාහිර ව සංඥායකයක් සංඥායිතයක් බවට පත් නොවෙයි.

එකම සංස්කෘතියක් තුළ වුව ද, එනම් මෙහි දී එක ම භාෂාවක වුව ද, වචනවලට, එනම් ශබ්දවලට, එනම් සංඥායකවලට විවිධ තේරුම් ලැබෙන්නේ විවිධ සන්දර්භවල ය. එනම් එක ම භාෂාවක වුව ද සංඥායකවලට විවිධ සංඥායිත වෙයි. උපාසකම්මා සිල් ගනියි කී තැන හා එයා හොඳ උපාසකම්මා යැයි කී තැන්හි එකම උපාසකම්මා යන සංඥායකය ලැබුණ ද එහි සංඥායිත දෙකක් වෙයි. ඒ සංඥායිත එකිනෙකට හාත්පසින් විරුද්ධ වීම ද මෙහි දී සලකා බැලිය යුතු ය.

දැන් අපි නැවතත් ගවයා හා bull යන සංඥායක දෙක ගනිමු. මේ සංඥායක සිංහල සංස්කෘතියෙහි හා ඉංගිරිසි සංස්කෘතියෙහි ජනිත කරන්නේ එකම සංඥායිත නොවේ. ඉංගිරිසිකාරයාගේ bull සිංහලයාගේ ගවයා නොවේ. අද පවා ගවයා යනු සිංහල සංස්කෘතියෙහි සිංහලයා තුළ යම් අනුකම්පාවක් දයාවක් උපදවන වචනයකි. ගවමස් කෑම අදත් පහත් ක්‍රියාවක් ලෙස සිංහලයෝ සලකති. ඔවුන් ගවමස් කන්නේ ද යන්න මෙහි දී අදාළ නොවේ. එහෙත් ඉංගිරිසි සංස්කෘතියෙහි bull යැයි කී විට එවැනි සංඥායිතයක් නොලැබෙයි. ඉංගිරිසිකාරයාගේ bullshit යනු සිංහලයාගේ ගොම නොවේ. ඉංගිරිසියෙන් යමක් වැඩක් නැති දෙයක්, බොරුවක් ආදී වශයෙන් හැඳින්වීමට ද bullshit යන්න යොදා ගැනෙයි. සිංහලෙන් ගොම යන්න එවැනි සංඥායිතයක් ගෙන නොදෙයි.

මේ කරුණුවලින් පෙනී යන්නේ ගවයා හා bull යනු එකම නොවන බව ය. ඉංගිරිසි සිංහල ශබ්දකෝෂයක bull යන්නට ගවයා යැයි සඳහන් වුව ද ඉන් සම්පූර්ණ දෙය නොකියැවෙයි. සොසූර් පඬිවරයා මේ වෙනස පැහැදිලි කර ඉන් පසුව ඒ සංඥායිතයන් ඉක්මවා යන ප්‍රඥප්තයක් ගැන සඳහන් කරයි. ඒ නම් අමූලික බොරුවකි. ඔහු එතැනට වැටෙන්නේ ඔහුගේ බටහිර යුරෝපීය ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මේ සියළු සාපේක්ෂතාවන් ඔබ්බෙන් වූ යථාර්ථයක් තිබිය යුතු බැවිනි. සිංහලෙන් ගවයා කීව ද ඉංගිරිසියෙන් bull යැයි කීව ද කියැවෙන දෙයට වඩා යමක් භාෂාවලින් තොරව පවතින බව සොසූර් පඬිවරයාගේ අදහස ය. ඒ බටහිර සංස්කෘතියෙහි ඇති යෙහෝවා සංකල්පයෙන් ලැබෙන්නකි. යෙහෝවා දෙවියන් වහන්සේ වියුක්ත ව මිනිසාගෙන් වෙන් වී යථාර්ථයක් ලෙස ගැනීම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සිදුවෙයි. මේ ඊනියා යථාර්ථයෙන් පිටපැනීමට බටහිරයන්ට නොහැකි ය. ඔවුන්ගේ මෙරට සිටින අගුටුමිට්ටු අනුකාරක ඇංකරයන්ට කෙසේවත් නොහැකි ය.

© Prof. Nalin De Silva

එහෙත් මේ ඊනියා යථාර්ථය කුමක් ද? එය වචනයෙන් කිව නොහැකි ය. ගවයා හා bull ට ඔබ්බෙන් ඇති ඒ ඊනියා ප්‍රඥප්තය කුමක් ද? සොසුර් පඬිවරයාගේ බංකොලොත්කම හෙළිවන්නේ මෙහි දී ය. ඔහු එපමණ බංකොළොත් නම් ඔහු අනුකරණය කරන අඟුටුමිට්ටි ඇංකරයන් ගැන කියනුම කවරේ ද? ගවයාට ඔබ්බෙන් ඇති ප්‍රඥප්තය කුමක් දැයි සොසුර් විද්වතාට වචනයෙන් කිව හැකි නොවේ. ඔහුට එය සිතුවමකින් සංගීත ඛණ්ඩයකින් හෝ වෙනත් එවැන්නකින් පැහැදිලි කර දිය හැකි නොවේ. ඒ සියල්ල මනස හා සම්බන්ධ වෙයි. මනසින් තොරව ඒ කිසිවක් නොකළ හැකි ය. එහෙත් මනස යොදාගත් විගස සංස්කෘතික ලක්ෂණවලට ඉඩ දීමට සිදුවෙයි. මනස සංස්කෘතියෙන් හසුරුවනු ලැබෙයි. (මනස සංස්කෘතිය වෙනස්කිරීමට ද උපකාර වන බව චක්‍රීය චින්තනය නොතේරෙන බටහිරයන්ගේ ඒකරේඛීය චින්තනය අනුකරණය කරන ඇංකරයන්ගේ දැනගැනීම පිණිස සටහන් කළ යුතු ය.)

සොසුර් විද්වතා කරන්නේ එසේ ප්‍රඥප්තයක් ඇති බව කීම පමණකි. එය යෙහෝවා දෙවියන් වහන්සේ ඇතැයි කීමට වඩා වෙනස් නොවේ. මේ යෙහෝවා දෙවියන් වහන්සේ විස්තර කිරීමට කිසිවකුටවත් නොහැකි ය. බටහිරයන්ගේ ඊනියා යථාර්ථය එබඳු ය. මනසින් තොරව යථාර්ථයක් පවතින බව මනසින් තොරව කිසිවකුටවත් පෙන්වා දිය නොහැකි ය. කළ හැක්කේ මනසින් තොරව යථාර්ථයක් පවතින බව කීම පමණ ය. එහෙත් එයින් ඇති කාරිය කුමක් ද? ඕනෑම අයකුට ඕනෑම දෙයක් කීමට ඇති නිදහස යොදා ගනිමින් මෙවැනි දෑ කීමට හැකි වුවත් ඉන් ඇති පලක් නැත. මනසින් තොරව පොල් නොවැටෙයි. පොලය පොලයක් බව හඳුනාගන්නේ ම මනසිනි. වැටීම යන්න පොලයටත් වඩා අමාරු සංකල්පයකි. වැටීම යන්න උඩ පහත යන සංකල්ප සමග බැඳී ඇත. මේ සංකල්ප පමණක් නොව චලනය, එනම් කාලය විෂයයෙහි දුර වෙනස්වීම යන්න ද එහි වෙයි. කාලය යනු කුමක් ද? එය තනිකර මනසෙහි නිර්මාණයකි. සිංහල බෞද්ධයන් කියන අයුරින් නම් කාලය යනු පඤ්ඤත්තියක් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva